# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,564 — 1958 ඔක්තෝබර් 24 වැනි සිකුරාදා — 24.10.1958**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)**


# IV වැනි කොටස—පළාත් පාලනය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 897 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... | — | අය වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... | 901 |
| අතුරු ව්‍යවස්ථා ... ... | 897 | මාර්ග කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපණත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... | 902 |


# පළාත් පාලන නිවේදන

ඇල්.ජී.ඩී.—ජීඕ. 14/10

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (201 වැනි පරිච්ඡේදයේ) 22 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැලඹ ගම් ප්‍රදේශයේ ගම්කාරක සභාව විසින් සම්පාදිතව, 1947 ක්වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් එතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර ස්ථිර කරන ලද නියෝග.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

කොළඹ, ඔක්තෝබර 13, 1958.

**නියෝග**

1. ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ ප්‍රකාශ කරන ලද සතුන් මරන පොදු ස්ථානය හා සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ ස්ථාන සෞඛ්‍ය පරීක්ෂක තැන භාරයේ තිබිය යුතුය. ඒ සතුන් මරන ස්ථානයෙහි හා සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ ස්ථානයන්හි මනා පරිපාලනය හා සනීපාරක්ෂාව සම්බන්ධයෙන් ඒ නිලධාරි තැන විසින් වගකිය යුතුයි.

2. (1) කිසිම අයකු විසින් කිසිම සතකු—

(අ) ඒ සතා පරීක්ෂාකර බැලීම පිණිස කාරක සභාව විසින් පත්කරන ලද නිලධාරි තැන විසින් පරීක්ෂාකොට මිනිසුන්ගේ ආහාර පිණිස මරනු ලැබීමට සුදුසුයයි අනුමතකර තිබේනම්, හෝ

(ආ) පූ. භා. 7 ටත් 9 ටත් අතර කාලයේදී හෝ මිස නැත්නම් සතුන් මරන ස්ථානයේදී හා සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ ස්ථානයන්හිදී නොමැරිය යුතුයි; එහෙත් කවර අවස්ථාවකදී වුවත් මෙහි සඳහන් වේලාවට වඩා වෙනස්වූ යම් වේලාවක යම් සතකු මැරීම සඳහා ප්‍රධානතුමා විසින් බලය දිය හැකියි.

(2) කිසිම අයකු විසින් කිසිම සතකු—

(අ) (1) වැනි ඡේදය යටතේ ඒ සතා මැරීම සඳහා අනුමත කළ වේලාවේ සිට පැය 72 ක කාලයක් ගතවූවාට පසු කොයියම් වේලාවක, හෝ

(ආ) (1) වැනි ඡේදය යටතේ අනුමත කළාට පසු ඒ සතා සතුන් මරන ස්ථානයට අයිති භූමියෙන් හෝ සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ ස්ථාන වලින් පණ පිටින් ඉවත්කර ඇත්තේ නම්,

ඒ සතා නැවතත් පරීක්ෂාකොට මිනිසුන්ගේ ආහාර පිණිස මරනු ලැබීමට සුදුසුයයි (1) වැනි ඡේදය යටතේ අනුමත කරන ලද්දේ නම් මිස නැත්නම් සතුන් මරන ස්ථානයේදී හා සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ ස්ථානයන්හිදී නොමැරිය යුතුයි.

3. සතුන් මරන ස්ථානයට හෝ සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ ස්ථානවලට යම් සතකු ගෙන එන සෑම අයකු විසින්ම ඒ සතා සතුන් මරන ස්ථානයට අයිති භූමිභාගයෙහි නැවැත්වා සිටින කාලය තුළ ඒ සතාට සෑහෙන පරිදි කෑම, බීම නිසැකවම ලැබීම සඳහා අවශ්‍යවූ සෑම පිළිවෙතක්ම යොදාගත යුතුයි.

4. සතුන් මරන ස්ථානයට හෝ සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ ස්ථානවලට යම් සතකු ගෙන එන සෑම අයකු විසින්ම ඒ සතා මරනු ලැබීමට සුදුසු නැතැයි ප්‍රතික්ෂෙපකරන ලද්දේ නම් එසේ ප්‍රතික්ෂෙප කළ වහාම ඒ සතා ඒ ස්ථානය පිහිටි භූමිභාගයෙන් ඉවත් කළ යුතුයි. නැතහොත් ඉවත් කරවිය යුතුයි.

5. යම් සතකු 2 වැනි නියෝගය යටතේ මැරීමට සුදුසුයයි අනුමත කළාට පසු ඒ සතා ලෙඩ සහිත බව හෝ මිනිසුන්ගේ ආහාර පිණිස මරනු ලැබීමට නුසුදුසු බව පෙනී ගියහොත් සෞඛ්‍යය පිළිබඳ වෛද්‍ය නිලධාරිතුමා විසින් හෝ 2 වැනි නියෝගයේ සඳහන් නිලධාරි තැන විසින් හෝ ඒ සතා මැරීම තහනම් කළ හැකිය.

6. සතුන් මරන ස්ථානයේදී හා සතුන් මැරීම සඳහා නියම කරන ලැබූ ස්ථානයන්හිදී මරන ලද යම් සතකුගේ මස් හෝ අතුනුබහන් ආදිය සෞඛ්‍යය පිළිබඳ වෛද්‍ය නිලධාරිතුමාගේ නොහොත් 2වැනි නියෝගයේ සඳහන්වූ නිලධාරි තැනගේ කල්පනාවේ හැටියට ලෙඩ සහිතව හෝ මිනිසුන්ගේ ආහාරයට නුසුදුසුව තිබේ නම් එතුමා විසින් ඒ මස් හෝ අතුනුබහන් ආදිය වහාම විනාශකර දැමීමට සැලැස්විය යුතුයි. එසේ නැතහොත් ඒ මස් හෝ අතුනුබහන් ආදිය විකිණීම පිණිස තැබීම හෝ මිනිසුන් විසින් ආහාර පිණිස ගැනීම හෝ වලකින අන්දමින් ඉවත් කර විය යුතුයි.

7. සතුන් මරන ස්ථානය හා සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ ස්ථාන භාරවූ නිලධාරි තැන විසින් මිනිසුන්ගේ ආහාරය පිණිස මරනු ලැබීමට සුදුසුයයි අනුමතකර නැත්නාවූ හෝ 5 වැනි නියෝගයේ විධිවිධාන පරිදි මැරීම තහනම්කර තිබෙන්නාවූ හෝ කිසිම සතකු මස් පිණිස මැරීමට අවසර නොදිය යුතුයි.

8. (1) කිසිම අයකු විසින් මිනිසුන්ගේ ආහාරයට නුසුදුසුයයි 6 වැනි නියෝගය යටතේ ප්‍රකාශ කරන ලද කිසිම මසක් හෝ අතුනුබහන් ආදියක් සෞඛ්‍යය පිළිබඳ වෛද්‍ය නිලධාරි තුමාගේ නොහොත් 2 වැනි නියෝගයේ සඳහන්වූ නිලධාරිතැනගේ නියමය යටතේ මිස නැත්නම් සතුන් මරන ස්ථානයෙන් හෝ සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ ස්ථානවලින් ඉවත් නොකළ යුතුයි.

(2) කිසිම අයකු විසින් මිනිසුන්ගේ ආහාරය පිණිස අදහස් කරන ලද යම් සතකුගේ කුණපය, ඒ කුණපයේ ඉස්සරහ ගාත්වලත් පස්සා ගාත්වලත් සතුන් මරන ස්ථානය භාර වූ නිලධාරිතැන විසින් "වැ.උ.බ. ග. ස." යන මුද්‍රාව පිහිටුවා තිබේ නම් මිස නැත්නම් සතුන් මරන ස්ථානයෙන් හෝ සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ ස්ථාන වලින් ඉවත් නොකළ යුතුයි.

9. වෙනත් යම් සතකු ඉදිරියේදී හෝ ඒ ස්ථානයෙහි කලින් මරන ලද සෑම සතකුගේම කුණපය ඉවත්කර හෝ මුවාකර ස්ථාන ශුද්ධ පවිත්‍ර කරන තුරු හෝ කිසිම සතකු නොමැරිය යුතුයි.

10. (1) කාරණයේ හැටියට සතුන් මරන ස්ථානය හෝ සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ ස්ථාන පාවිච්චි කිරීම සඳහා පහත සඳහන් වන් අන්දමේ ගාස්තුවක් කාර්‍ය සභාවට කලින් ගෙවිය යුතුයි. ගාස්තුව ගෙවූ බවට සාක්ෂ්‍යයක් වශයෙන් කාර්‍ය සභාවේ කාර්‍යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් නැතුව කිසිම සතකු මැරීමට ඉඩ නොදිය යුතුයි :—

| | | |
|---|---|---|
| හරකුන් සඳහා එකකුට ... ... | රු. | 4.50 |
| බැටළුවන්, එළුවන් හෝ ඌරන් සඳහා එකකුට | රු. | 2.00 |

(2) මිනිසුන්ගේ ආහාරය පිණිස මරනු ලැබීමට සුදුසුමෙන් 2 වැනි නියෝගය යටතේ සතකු අනුමතකර තිබෙන විට ඒ සතා මස් මඩුවට ඇතුල් කිරීමට ප්‍රථමයෙන් ගාස්තුව ගෙවූ බවට සාක්ෂ්‍යයක් වශයෙන් කාර්‍ය සභාවේ කාර්‍යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් පෙන්වා සිටිම වුවමනා නොකෙරෙයි.

11. සතුන් මරන ස්ථානය හෝ සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ ස්ථාන භාර අය විසින් සතුන් මරන ස්ථානයට හෝ සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ ස්ථානවලට ගෙන එන ලද සියළුම හරකුන් ගේ රෙජිස්ටරයක් මේ සමඟ තිබෙන ෆෝරමයෙහි පරිදි තබාගත යුතුයි :—

| හරක් කුවිතාන්සියේ නො: | වර්ගය | පාට | වයස | හං නිවරන | | මස්මරන්නාගේ නම | හරක් කොටුවට ඇතුල් කළ වේලාව සහ දිනය | පරීක්ෂාකර බැලූ දිනය | මෙරාගිය දිනය | වැඩිපුර කරුණු | හරක් භාරගන්නා නිලධාරි තැනගේ කෙටි අත්සන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | දකුණු පැත්ත | වම පැත්ත | | | | | | |
| | | | | | | | | | | | |

12. මේ නියෝගවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කාර්‍ය සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ;

"කාර්‍ය සභාව" යනුවෙන් වැ.උ.බ. ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ;

"ආඥාපනත" යනුවෙන් මස් පිණිස සතුන් මැරීමේ ආඥාපනත (201 වැනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

13. වරින් වර සංශෝධනය කරනු ලැබ 1951 ක්වූ නොවැම්බර් මස 30 වැනි දින අංක 10,325 දරණ ගැසට් පත්‍රයේ පළවූ නියෝග මෙයින් අවලංගු කරනු ලැබේ.

ඇල්.ජී.ඕ./ජී. 14/37.

## 1952කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනත

1952කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ දොම්පේ ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්මත කර ගන්නා ලද පහත දැක්වෙන යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙහි පළ කරනු ලැබේ.

### යෝජනාව

"පළාත් පාලන අමාත්‍ය වරයා විසින් සම්පාදනය කරන ලද්දාවූද සෙනේට් මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 10 වෙනි දින අංක 10,560 දරණ "ගැසට්" පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 1, 3, 4, 5, 6, 7, 8, 9, 10, 11, 12, 13, 14, 15, 16, 17, 19, 20, 21, 22, 23, 24, 25, 26, 27, 28, 29, 30, 31, 32, 33, 34, 35, 36, 37 වන කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මතකර ගැනීමට දොම්පෙ ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් 1952 කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වන වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කරනු ලැබේ."

කේ. ඩී. චන්ද්‍රපාල,
සභාපති.

ගම්කාර්‍ය සභා කාර්‍යාලය,
දොම්පෙ.
24. 9. 58.

---

ඇල්.ජී.ඕ.—ජීඅයි 11/18 ඊ

## 1952කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනත

1952කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ ගලසියපත්තුව ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්මත කරනලද පහත දැක්වෙන යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙහි පළකරනු ලැබේ.

### යෝජනාව

ප්‍රදේශපාලන ඇමතිතුමා විසින් සම්පාදනය කරන ලද්දවූ ද සෙනේට් මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රීමණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනලද බව 1953ක්වූ අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දවූ ද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 1, 2, 3, 4, 5, 7, 8, 9, 10, 11, 12, 13, 14, 15, 16, 17, 23, 24, 25, 28, 30, 32, 33, 34, 35, 36 සහ 37 යන කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කරගැනීමට ගලසියපත්තුව ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් 1952 කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ මෙයින් යෝජනා කරනු ලැබේ.

ඇස්. බී. රාජකරුණා,
ගලසියපත්තුව ගම්කාර්‍යසභාවේ සභාපති තැන.

ගම්සභා කාර්‍යාලය,
ගලසියපත්තුව,
17. 9. 58.

---

# අතුරු ව්‍යවස්ථා

ඇල්.ජී.—ඕ 160/41/ඇල්ජීඕ—ජීජ් 11/55/2.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ 49 වැනි වගන්තිය යටතේ බදුලු දිස්ත්‍රික්කයේ සිත්තරම් පළාත ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවැරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම්තැන.

1958 ඔක්තෝබර් මස 13 වැනි දින,
කොළඹ දීය.

## රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද

1. (1) ආඥපනතේ 47 වැනි වගන්තිය යටතේ අයකරනු ලබන රථවාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත් වූ යම් රථවාහනයක් හෝ සතකු අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන හෝ සිටින්නා වූ සෑම අයෙකු විසින්ම සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් "ඒ" උපලේඛනයෙහි දක්වෙන පෝර්මයේ ප්‍රකාර විස්තර උපලේඛනයක් ප්‍රධාන තුමාට සැපයිය යුතුයි. මේ පෝර්ම ගම් කායර්‍ය සභා කායර්‍යාලයෙන් ලබාගත හැකිය.

(2) ආඥපනතේ 47 වැනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳී සිටින අය විසින් 1959 වැනි වර්‍ෂය වෙනුවෙන් ඒ උපලේඛනය සම්පූර්ණකොට 1959 මාර්තු මස 15 වැනි දින හෝ ඊට මත්තෙන් ප්‍රධාන තුමා වෙත යැවිය යුතුයි. එකී අය ඒ වාහනය හෝ සතා හෝ අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන සිටින්නාවූ ඊට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන්වත් එකී අයගෙන් එබඳු උපලේඛනයක් අවශ්‍ය නැත.

2. ආඥපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයූවාවූ සෑම අයෙක්ම තව දුරටත් දැනුම්දෙනු ලැබීමක් නැතිව—

(අ) උපලේඛනයේ සඳහන් රථවාහන හා සතුන් සඳහා වූ බද්ද 1959 අවුරුද්ද වෙනුවෙන් ඒ අවුරුද්දේ මාර්තු මස තිස්එක් වෙනිද හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත්වෙති, තවද

(ආ) ඊට පසු එක් එක් වර්‍ෂය වෙනුවෙන් ඒ උපලේඛනයේ සඳහන් කරන ලදුව එකී වර්‍ෂයේ දවස් තිහකට වැඩි කාලයක් තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ එකී රථවාහන හා සතුන් සඳහාවූ බද්ද එකී එක් එක් අවුරුද්දේ මාර්තු මස තිස්එක් වෙනි ද හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති.

3. 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයූවාට පසු යම් කිසිවෙකු විසින් ඒ උපලේඛනයේ සඳහන් නොකරන ලද්දවූද, ආඥපනත යටතේ බද්දට යටත්වූද, යම් රථවාහනයක් හෝ සතකු අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම්, එක්හෝ ඉහතින් සඳහන් 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් උපලේඛනයක් සපයා නැත්තාවූ යම් කිසිවෙකු විසින් එකී බද්දට යටත් යම් රථවාහනයක් හෝ සතකු පළමුවෙන් අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් එවිට ඒ අය විසින් එබඳු යම් රථවාහනයක් හෝ සතකු අත්පත් කර ගැනීමේ හෝ තබා ගැනීමට නොහොත් පාවිච්චි කිරීමට පටන් ගැනීමේ දින සිට එක මාසයක් ඇතුළතදී සාමාන්‍යයෙන් මීට යාකොට ඇති "ඒ" උපලේඛනයේ සඳහන් පෝර්මයේ ප්‍රකාරයට ලියවිල්ලකින් වූ දැන්වීමකින් එසේ අත්පත් කර ගත් බව ප්‍රධාන තුමාට දැනුම් දිය යුතුයි.

4. ආඥපනතේ 47 (2) වැනි වගන්තියේ විධි විධාන වලට යටත්ව 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය සැපයූවා වූ සෑම අයෙක්ම එකී ලේඛනය සැපයූ අවුරුද්ද වෙනුවෙන් ද ඊට පසු සෑම අවුරුද්දක් වෙනුවෙන් ද එකී ලේඛනයේ සඳහන් කරනු ලැබ තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ රථවාහන හා සතුන් සඳහා වූ බද්ද ඒ සඳහා ප්‍රධාන තුමා විසින් තමාට දැනුම්දෙනු ලබන යම් කාලසීමාවක් ඇතුළතදී ගෙවීමට බැඳී සිටිති.

5. (1) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය හෝ සැපයූවාට පසු ඒ උපලේඛනයට ඇතුළත් කළා වූ හෝ ලේඛනයේ සඳහන් කළා වූ හෝ යම් රථවාහනයක් හෝ සතකු සම්බන්ධයෙන් වූ බද්ද ගෙවීමට බැඳීමෙන් ආඥපනතේ 47 (3) වැනි වගන්තිය යටතේ තමා නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින සෑම අයකු විසින්ම එසේ නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින්නේ අසවල් අසවල් හේතූන් නිසා යයි දක්වෙන ලියවිල්ලකින් වූ දැන්වීමක් වහාම ප්‍රධාන තුමා වෙත යැවිය යුතුයි.

(2) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය හෝ සැපයූවාට පසු ඒ රථවාහන හෝ සතුන් තබාගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළාවූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම් අත්හැරියා වූ සෑම අයකු විසින්ම ලියවිල්ලකින් වූ දැන්වීමකින් තමා ඒ සතා හෝ රථවාහනය තබාගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළ බව නොහොත් ඒ ගැන අයිතිවාසිකම් අත්හල බව වහාම ප්‍රධානතුමා වෙත ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

6. යම්කිසිවෙකු විසින් බද්ද ගෙවූවිට ප්‍රධානතුමා විසින් ඒ බද්ද ගෙවූ රථවාහන වෙනුවෙන් ඒ අයට මෙහි පහත සඳහන් උපලේඛනයෙහි "බී" පෝර්මයේ ප්‍රකාරයට ඒ ඒ රථවාහන සඳහා වෙන් වෙන් වශයෙන් යොදා ඇති විශේෂ අකුරුද තහඩු ද නිකුත් කරන අවුරුද්ද දක්වෙන ඉලක්කම්ද රථවාහන රෙජිස්ටරයේ ඒ ඒ රථවාහනය පිළිබඳවූ අංකය ද සටහන්කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුයි. එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙනයම් ලෙසකින් හෝ නොපැහැදිලිව නොහොත් මැකී ගොස් තිබෙතොත් ඒ තහඩුව අයිතිකාරයා විසින් එය ප්‍රධානතුමාට ආපසු භාරදිය යුතුයි. තවද ඔහු විසින් ශත පනහක් ගෙවූවිට ඔහුට අලුත් තහඩුවක් නැවැත ලබාගැනීමට අයිතිවාසිකම තිබේ. එබඳු යම් තහඩුවක් නැතිවී හෝ සොරාගෙන තිබෙන බැව් දිවුරුම් සහතිකයකින් හෝ වෙනයම් ලෙසකින් ප්‍රධානතුමාට ඒත්තු ගැනීමට සැලැස්සුවහොත් එතුමා විසින් අයිතිකාරයාගේ ඉල්ලීම පිටත් ඔහු විසින් ශත හැටක් ගෙවනු ලැබූ විටත් අලුත් තහඩුවක් නිකුත් කළ හැකිය.

7. සෑම රථවාහන අයිතිකරු විසින් හෝ භාරකරු විසින්ම 6 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ රථවාහනය වෙනුවෙන් නිකුත් කරන ලද තහඩුව ඒ රථවාහනයේ කාටත් පෙණෙන තැනක සවිකළ යුතුයි.

8. ප්‍රධාන තුමා විසින් හෝ එතුමාගේ ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියකු විසින් හෝ ඕනෑම පොලිස් නිලධාරියකු විසින් හෝ ඕනෑම මාවතක හෝ පාරක ගමනාගමනයෙහි යෙදී තිබෙන රථවාහනයක්, ඒ රථවාහනයෙහි, 7 වැනි අතුරු ව්‍යවස්ථාවේ ප්‍රකාර සවිකොට තිබියයුතු තහඩුව පරීක්‍ෂාකර බැලීම පිණිස නවත්වා නතර කිරීම නීත්‍යනුකූල වන්නේ ය. තවද ප්‍රධානතුමා විසින් හෝ එකී නිලධාරියා විසින් ඉල්ලීමක් කර සිටි කල්හි එකී ඕනෑම රථයක භාරකාරයා විසින් හෝ ඒ රථය පදවන්නා විසින් ඒ රථය නවත්වා ප්‍රධානතුමාට හෝ එහි නිලධාරියාට හෝ එකී තහඩුව පරීක්‍ෂාකර බැලීමට ඉඩදිය යුතුයි.

9. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කායර්‍ය සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ ;

"කායර්‍ය සභාව" යනුවෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ සිත්තරම් පළාත ගම්ප්‍රදේශයේ ගම්කායර්‍ය සභාව අදහස් කරනු ලැබේ ;

"ආඥපනත" යනුවෙන් ගම්සභා ආඥපනත (198 වෙනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

### "ඒ" උපලේඛනය

#### පෝර්මය

#### සිත්තරම් පළාත ගම්කායර්‍ය සභාව

රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථාවල ප්‍රකාරයට සැපයිය යුතු රථ වාහන හා/හෝ* සතුන් පිළිබඳ ලේඛනයයි.

අයිතිකාරයාගේ නම :————.
ඡන්දදායක කොට්ඨාශයේ අංකය :————.
ගම :————.

| රථවාහන හා/හෝ* සතුන් පිළිබඳ විස්තර | ගණන (වචන වලින්) | වෙනත් විස්තර |
| --- | --- | --- |
| කරත්ත, තිරික්කල හෝ ජින්රික්ෂෝ කරත්ත හැර ඕනෑම අත්දමක වාහන... | | |
| ගොන් දෙන්නා බඳින බර කරත්ත හෝ තිරික්කල ... ... | | |
| බර බාග කරත්ත හෝ තිරික්කල ... | | |
| අත් කරත්ත ... ... | | |
| ජින් රික්ෂෝ රථ ... ... | | |
| බයිසිකල් (වෙනත් විස්තර සඳහා සැපයූන කොටසේ සාදන ලද අයගේ නොම්මරය සඳහන් කරනු) ... ... | | |
| අලි .... ... | | |
| අශ්වයෝ ... ... | | |
| අශ්වතරයෝ ... ... | | |
| බූරුවෝ ... ... | | |

ඉහත සඳහන් විස්තරය සත්‍ය බවත් නිවැරදි බවත් මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

අයිතිකාරයාගේ අත්සන :————.

දිනය :————.

* නුවුවමනා වචන කපා හරිනු.

### "බී" උපලේඛනය

| | |
| --- | --- |
| කරත්තයක්, තිරික්කලයක් හෝ ජින් රික්ෂෝ රථයක් හැර වෙනත් ඕනෑම අත්දමක වාහනයක් සඳහා ... ... | සි.ග.වා. |
| සෑම ගොන් දෙන්නා බඳින බරකරත්තයක් හෝ තිරික් කලයක් සඳහා ... ... | සි.ග.බ.ක. |
| සෑම තනිගොනා බඳින බරබාග කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | සි.ග.බා.ක. |
| සෑම බයිසිකලයක් සඳහා ... ... | සි.ග.බ. |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... | සි.ග.අ.ක. |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... ... | සි.ග.ජි. |

# අය වැය ලේඛන

## කොලොන්නාව පළාත් ආණ්ඩු සභාව

### දෙවැනි අතිරේක වැය ශීර්ෂ—1958

| වැය ශීර්ෂය | ගණන රු. ශ. | සභා අනුමතිය |
|---|---|---|
| ඊ.—(3) (ඊ) වැසිකිළිනඩත්තුව ... ... ... | 3,500 0 | ... අංක 4 මහ සභාව—14.7.58 |
| ඒ.—(2) (අයි) ගණන් පරීක්ෂක ගාස්තු ... ... ... | 165 5 | ... අංක 5 මහ සභාව—14.7.58 |
| අයි.—(1) පරීක්ෂකවරුන්ගේ ගාස්තු ... ... ... | 200 0 | ... අංක 9 මහ සභාව—14.7.58 |
| ඒ.—(2) (ඊ) නඩු වියදම් ... ... ... | 1,000 0 | ... අංක 13 මහ සභාව—14.7.58 |
| ඒ.—(2) (ඇෆ්) ලිපි ද්‍රව්‍ය ආදිය ... ... ... | 2,000 0 | ... අංක7 මහ සභාව—11.8.58 |
| බී.—(8) මාර්ග වැඩි දියුණුව සඳහා ... ... ... | 10,000 0 | ... අංක 8 මහ සභාව—11.8.58 |
| ඊ.—(6) (බී) ආරෝග්‍ය ශාලා—නඩත්තුව ... ... ... | 1,300 0 | ... අංක 9 මහ සභාව—11.8.58 |
| ඊ.—(5) (සී) වතුර සැපයීම—නඩත්තුව ... ... ... | 750 0 | ... එම |
| ඩී.—(4) ගොඩනැගිලි—නඩත්තුව ... ... ... | 4,350 0 | ... එම |
| ඊ.—(6) (බී) ආරෝග්‍යශාලා—නඩත්තුව ... ... ... | 75 0 | ... එම |
| ඒ.—(2) (ජේ) දුම්රිය ප්‍රවේශපත්‍ර ... ... ... | 1,000 0 | ... අංක 11 මහ සභාව—11.8.58 |
| ඩී.—(1) ගොඩනැගිලි—වේතන ... ... ... | 500 0 | ... අංක 16 මහ සභාව—11.8.58 |
| ඊ.—(2) (බී) කරත්ත, හරකුන් හා ලොරි ... ... ... | 1,000 0 | ... අංක 9 මහ සභාව—8.9.58 |
| ඒ.—(2) (ඊ) නඩු වියදම ... ... ... | 1,000 0 | ... එම |
| බී.—(2) මාර්ග—නඩත්තුව ... ... ... | 5,000 0 | ... එම |
| ඊ.—(5) (සී) වතුර සැපයීම—නඩත්තුව ... ... ... | 2,500 0 | ... එම |
| ඩී.—(4) ගොඩනැගිලි—නඩත්තුව ... ... ... | 900 0 | ... අංක 12 මහ සභාව—8.9.58 |
| ඒ.—(2) (ඇෆ්) ලිපිද්‍රව්‍ය ආදිය ... ... ... | 455 0 | ... අංක 17 මහ සභාව—8.9.58 |
| ඊ.—(3) (බී) කරත්ත, හරකුන් හා ලොරි ... ... ... | 1,374 75 | ... අංක 18 මහ සභාව—8.9.58 |
| ඒ.—(2) (ඇෆ්) ලිපි ද්‍රව්‍ය ආදිය ... ... ... | 1,000 0 | ... අංක 5 මහ සභාව—13.10.58 |
| ජේ.—(1) (ඩී) විදුලිබලය මිලට ගැනීම ... ... ... | 8,500 0 | ... අංක 17 මහ සභාව—13.10.58 |
| ජේ.—(4) (බී) විදුලිය වැටුප් ආදිය ... ... ... | 2,500 0 | ... අංක 12 මහ සභාව—13.10.58 |
| ජේ. (4) (ඊ) විදුලිය වියදමට දෙන මුදල ... ... ... | 350 0 | ... අංක 13 මහ සභාව—13.10.58 |
| | 49,419 80 | |

මෙම අතිරේක වැය ශීර්ෂ ඉහත පෙනෙනාකාර සභා සම්මත කරන ලදී.

සී. අමරසිංහ,
කොලොන්නාව පළාත් ආණ්ඩු සභාවේ සභාපති,

පළාත් ආණ්ඩු සභා කාර්‍යාලය,
කොලොන්නාව, 17.10.58.

---

# විවිධ දැන්වීම්

## කොලොන්නා පළාත් ආණ්ඩු සභාවේ වර්‍ෂ 1959 සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බදු 1939 වර්‍ෂයේ අංක 61 දරණ පළාත් ආණ්ඩු සභා ආඥාපනත

වර්‍ෂ 1939 අංක 61 දරණ පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ 173 වෙනි ඡේදයේ අනුව කොලොන්නා පළාත් ආණ්ඩු සභාව මගින් පසුගිය වර්‍ෂවල මෙන් රථවාහන සහ සතුන් පිළිබඳ 1959 වර්‍ෂය සඳහා පහත සඳහන් බදු පනවා ඇති බවද, එම බදු මුදල් පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ 176 යේ තුන්වෙනි ඡේදය අනුව එම බදු මුදල් 1959 වර්‍ෂයේ මාර්තු මාසයේ 31 වෙනි දිනට හෝ ඊට ප්‍රථම කොලොන්නා නගර සභාවට ගෙවිය යුතුයි.

සී. අමරසිංහ,
සභාපති, කොලොන්නා පළාත් ආණ්ඩු සභාව.

පළාත් ආණ්ඩු සභා කාර්‍යාලය,
කොලොන්නාව-වැල්ලම්පිටිය.

### උප ලේඛනය

| | |
|---|---|
| මෝටර් රථය, රෝද තුනේ මෝටර් රථය, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, කරත්ත, අත්කරත්ත, ජින් රික්ෂෝ, බයිසිකල් හෝ රෝද තුනේ බයිසිකල් හැර ඕනෑම අන් දමේ අනිත් වාහනයකට ... | රු. 5.00 |
| ඕනෑම බයිසිකලයකට හෝ රෝද තුනේ බයිසිකලයකට හෝ බයිසිකල් රථයකට හෝ රෝද තුනේ බයිසිකල් මෝටර් රියකට හෝ කරත්තයකට— | |
| වෙළඳාම සඳහා පාවිච්චි කරන ... | රු. 3.00 |
| වෙළඳාම් කටයුතු සඳහා පාවිච්චි නොකරන ... | රු. 1.00 |
| ගොන් දෙන්නා බැඳි සෑම කරත්තයකට හෝ තිරික්කලයකට ... ... ... | රු. 3.00 |
| තනි ගොනා බැඳි සෑම කරත්තයකට හෝ තිරික්කලයකට ... ... ... | රු. 2.00 |
| සෑම අත් කරත්තයකට ... ... | රු. 2.00 |
| සෑම ජින් රික්ෂෝවකට ... ... | රු. 2.00 |
| සෑම අශ්වයෙකුටම හෝ පෝනියෙකුට හෝ කොටළුවෙකුට ... ... ... | රු. 2.00 |
| සෑම ගොනෙකුට හෝ බූරුවෙකුට ... ... | රු. 1.00 |

---

## කොලොන්නා නගර සභාව

### සූනඛයන් ලියා පදිංචි කිරීමේ ආඥාපනත 334 වෙනි පරිච්ඡේදය

**1959 වර්‍ෂයේ සුනඛ බදු**

සූනඛයන් ලියා පදිංචි කිරීමේ ආඥාපනතේ 334 වෙනි පරිච්ඡේදයේ 4 වෙනි ඡේදය අනුව කොලොන්නාව නගර සභා සීමාව තුළ සිටින සෑම බැල්ලියෙකුට හෝ බල්ලෙකුට ලියාපදිංචි කිරීමේ ගාස්තුව වශයෙන් රුපියල් 1.50 ක් ගෙවීමට පනවා ඇති බවද එම ලියාපදිංචි කිරීමේ ගාස්තුව 1959 වර්‍ෂයේ මාර්තු මස 31 වෙනි දිනට ප්‍රථම කොලොන්නා නගර සභාවට ගෙවිය යුතුයි.

සී. අමරසිංහ,
සභාපති, කොලොන්නා පළාත් ආණ්ඩු සභාව.

වර්‍ෂ 1958ක් වූ ඔක්තෝබර් මස 15 වෙනි දින,
කොලොන්නා පළාත් ආණ්ඩු සභා කාර්‍යාලයේ දීය.

---

## කිණිගොඩ කෝරළේ ගම්කාර්‍ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය එහි සඳහන් ස්ථානයෙහි 1959 වර්‍ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා බල පත්‍ර ඉල්ලා අයදුම් පතක් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වෙනි වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන කිණිගොඩ කෝරළේ ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුද්ධ වන්නේ කුමන හේතුන් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපතක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට 28 දිනක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

### උප ලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය සහ වෙළඳාම |
|---|---|
| 1. ඇන්. ඇම්. ඒ. සතාර්— රඹුක්කන | ජා හොටියා කොටුව— හේවාදිවෙල හරක් මස් කඩයක් |

පී. ආර්. රත්නායක,
කිණිගොඩ කෝරළේ ගම්කාර්‍ය සභාවේ සභාපති තැන.

වර්‍ෂ 1958 ක් වූ ඔක්තෝබර් මස 18 වෙනි දින,
කිණිගොඩ කෝරළේ ගම්කාර්‍ය සභා කාර්‍යාලයේ දීය.
නාවගමුව-රඹුක්කන.

---